හොඳ මිතුරන් සොයාගත හැක්කේ කෙසේද?

මඟ පෙන්වීම්: නිස්කලංක තැනක් තෝරාගන්න. අදාළ කොටස කියවන විට ඔබත් එම ස්ථානයේ සිටිනවා කියා සිතන්න.

ප්‍රධාන චරිත: යොනාතාන්, දාවිත් හා සාවුල්

සාරාංශය: දාවිත් ගොලියත්ව මරා දැමුවායින් පසුව යොනාතාන් දාවිත්ගේ හොඳම මිතුරා වුණා.

❶ ***සිතින් මවාගන්න.—1 සාමුවෙල් 17:57–18:11; 19:1; 20:1-17, 41, 42 කියවන්න.***

සාවුල්ගේ පෙනුම ඔබ විස්තර කරන්නේ කෙසේද? (1 සාමුවෙල් 10:20-23 දක්වා කියවන්න.)

දාවිත්ට යොනාතාන්ව මුණගැසුණු විට දාවිත් යෞවනයෙකුව සිටින්න ඇති. ඔබ දාවිත්ගේ පෙනුම විස්තර කරන්නේ කෙසේද? (1 සාමුවෙල් 16:12, 13 කියවන්න.)

1සාමුවෙල් 20වන පරිච්ඡේදයේ අවසානයේ සඳහන් ආකාරයට දාවිත් හා යොනාතාන් එකිනෙකාගෙන් වෙන්වූ අවස්ථාවේදී ඔවුන් දෙදෙනාට කෙසේ හැඟෙන්න ඇද්ද?

❷ ***නවත් ගැඹුරට සිතන්න.***

"යොනාතාන්ගේ සිත දාවිත් වෙත ඇදී ගියේය" කියා 1 සාමුවෙල් 18:1හි සඳහන් වෙනවා. යොනාතාන්ගේ සිත ඇදී යෑමට තරම් දාවිත් තුළ තිබූ යහපත් ගුණාංග මොනවාද? (1 සාමුවෙල් 17: 45, 46 කියවන්න.)

යොනාතාන්, දාවිත්ට වඩා අවුරුදු 30කින් පමණ වැඩිමල් වුණත් "කිට්ටු මිතුරන්" වීමට ඔවුන්ට උපකාරවත් වන්න ඇත්තේ මොනවාද?

සැබෑ මිතුරන් තුළ තිබිය යුතු ලක්ෂණ සම්බන්ධ-යෙන් දාවිත් සහ යොනාතාන්ගෙන් ඉගෙනගත හැක්කේ කුමක්ද? (හිතෝපදේශ 17:17; 18:24 කියවන්න.)

යොනාතාන් තම පියාට වඩා දාවිත්ට විශ්වාසවන්තව සිටියේ ඇයි?

3 ***පහත සඳහන් දේවල් ගැන ඔබ ඉගෙනගත් දේ ලියන්න.***

මිත්‍රත්වය.

විශ්වාසවන්තකම.

වැඩිහිටි අයව මිතුරන් කරගැනීම.

ඔබට සැබෑ මිතුරන්ව සොයාගත හැක්කේ කෙසේද?

4 ***සලකා බැලූ කොටසින් ඔබේ සිතට නඳින්ම කාවැදුණේ කුමක්ද? ඒ ඇයි?***

www.jw.org © 2010 Watch Tower Bible and Tract Society of Pennsylvania